# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1725/15 — 2011 සැප්තැම්බර් 29 වැනි බ්‍රහස්පතින්දා - 2011.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

### බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තිය යටතේ බල පැවැත්වෙන රීති

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තියේ 14 සහ 11(2) වගන්ති යටතේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව පහත රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

හේවාමාතරගේ උපාලි කොඩිකාර,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,<br>
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,<br>
ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ<br>
ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 27 වැනි දින,<br>
බත්තරමුල්ල,<br>
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,<br>
අංක 204 දරන ස්ථානයේ පිහිටි,<br>
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,<br>
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,<br>
ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තිය යටතේ බල පැවැත්වෙන රීති

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තියේ 14 සහ 11(2) වගන්ති යටතේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරයා විසින් පනවන ලද රීති.

1A - PG 001292— 535 (2011/09)

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය**

01. මෙම රීති බස්නාහිර පළාත් සභාවේ 2010 සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

**පාලන අධිකාරියේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම**

02. (1) අධ්‍යක්ෂවරයා විසින් පාලන අධිකාරියේ සියලුම රැස්වීම් කැඳවිය යුතු වන්නේ ය.

(2) රැස්වීම පැවැත්වීමට දින තුනකට පෙර, අධිකාරියේ සාමාජිකයින්ට න්‍යාය පත්‍රය ලැබීමට සැලැස්විය යුතු ය.

(3) හැකි සෑම විටම අධිකාරියේ රැස්වීම්, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ දී පැවැත්විය යුතු ය.

(4) අධිකාරියේ ඡන්ද විමසීමක දී පක්ෂව හා විපක්ෂව ඡන්ද සමාන වූ විටෙක අධිකාරියේ සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමි වන්නේ ය.

(5) සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ ලේඛන තබා ගැනීම අධ්‍යක්ෂවරයාගේ වගකීම් වේ.

**අධ්‍යක්ෂගේ බලතල හා කාර්යයන්**

03. අධ්‍යක්ෂවරයා විසින් පහත සඳහන් බලතල උපයෝගි කර ගනිමින් අදාල කාර්යයන් ඉටුකල යුතු ය.

(1) අධිකාරියේ බලතල හා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීම.

(2) අධිකාරිය ගනු ලබන තීරණ පිළිබඳ වාර්තා අනුපිළිවෙලට ගොනුකර තැබීම.

(3) අධිකාරිය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කරවීම, පසු විපරම් කිරීම සහ අධිකාරියට පසු වාර්තා සැපයීම.

(4) අධිකාරිය අනුමත කරන ප්‍රතිපත්ති අනුව, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය සඳහා කෙටිකාලීනව, මධ්‍ය කාලීනව හා දිගු කාලීනව සැලැස්මක් සකස් කර අධිකාරියේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීම.

(5) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර අධිකාරියේ අනුමැතිය ගැනීම.

(6) වාර්ෂික ඇස්තමේන්තු ගත සීමාවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී , ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු සකසා අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම.

(7) සෑම කාර්තුවක් අවසානයේදී ම ත්‍රෛමාසික ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාවක් පිළියෙල කළයුතු අතර, එම වාර්තාව කාර්තුව අවසාන වී දින 30ක් ඇතුළත අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම.

(8) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ වාර්ෂික ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් නිසි පරිදි ගණන් තැබීමට සැලැස්වීම හා පාලන අධිකාරියට වාර්තා කිරීම.

(9) නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික, සේවා කොන්දේසි සහ බඳවා ගැනීම් පරිපාටි අධිකාරිය සහ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන ඉටු කිරීම.

(10) අධිකාරිය සතු සියලුම වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම, භාරකාරත්වය දැරීම හා තොග ලේඛනගතකර පවත්වාගෙන යාම.

(11) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ සේවා හා පහසුකම් සඳහා අයකරන ගාස්තු අධිකාරියේ අනුමැතිය සහිතව නියම කිරීම.

(12) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ සේවා හා පහසුකම් වෙන් කරවා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් සකස් කර අධිකාරියේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක කිරීම.

(13) සියලුම ආකෘති පත්‍ර, අයදුම් පත්‍ර, සේවා ගාස්තු, ගාස්තු සහන ලබාදීම, අත්තිකාරම් හා මුළු මුදලින් ඉතිරිව අයකර ගැනීම, දඩමුදල් ප්‍රමාණයන් අධ්‍යක්ෂවරයා විසින් පිළියෙල කර අධිකාරියේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීම.

(14) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ සේවාවන් හෝ පහසුකම් හෝ ලබාගන්නා කුමන හෝ පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ ආයතනයක් හෝ විසින් අදාල කාල සීමාවේ දී ආයතනය තුළ පිළිපැදිය යුතු, අනුගමනය කළ යුතු හා වැළකී සිටිය යුතු කරුණු ඇතුළත් කර කොන්දේසි මාලාවක් පිළියෙල කර, අධිකාරියේ අනුමැතිය ඇතිව ක්‍රියාවේ යෙදවීම.

(15) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය තුළ කරනු ලබන රඟ දැක්වීම්, සංගීත ප්‍රසංග, විනෝද කටයුතු හෝ වෙනත් කාර්යයකින් ජාතික ආරක්ෂාවට හෝ දේශීය සංස්කෘතියට හෝ අගතියක් සිදුවන්නේ නම් එය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හෝ කටයුතු කිරීම හා ඒ පිළිබඳව අධිකාරියට වාර්තා කිරීම.

(16) බාහිර උපදේශකවරුන් විසින් පවත්වනු ලබන පාඨමාලාවන් පිළිබඳව නිර්ණායකයන් නියම කිරීම සහ ඒ අනුව කටයුතු සිදුවන බවට සහතික වීම.

(17) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ, එහි පරිශ්‍රයේ, එහි ස්ථිර හා තාවකාලික සියලු භෞතික සම්පත්වල හා සියලු පද්ධතීන්වල කල් පැවැත්ම හා යහ පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය නඩත්තු අවශ්‍යතා, ක්‍රමවේදයන් හා ඒවා ඉටුකල යුතු නිශ්චිත කාලප්‍රාන්තර හඳුනාගැනීම, සුදුසු ක්‍රියාත්මක යාන්ත්‍රනයක් ස්ථාපනය කර, සමීප අධීක්ෂණයක් පවත්වා ගැනීම.

04. පාලන අධිකාරියේ මුල්‍ය හා පරිපාලන කාර්ය පරිපාටීන්.

(1) මුදල් වර්ෂය අවසන් වීමට මසකට පෙර, ඉදිරි වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අධ්‍යක්ෂ විසින් අධිකාරියට ඉදිරිපත් කර සම්මත කරගත යුතු ය.

(2) අධිකාරියේ අවසන් ගිණුම්, එම වර්ෂය අවසාන වී එළඹෙන වර්ෂයේ මාර්තු 31ට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා මගින් විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු ය.

(3) අවසන් ගිණුම්, සභාපති හා අධ්‍යක්ෂ යන දෙදෙනා විසින්ම අත්සන් තැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් අනුමත කරනු ලබන රජයේ බැංකුවක, අධිකාරියේ අරමුදලේ බැංකු ගිණුම පවත්වාගෙන යා යුතු ය.

(5) අධිකාරියේ ලැබීම් හා ගෙවීම් පරිපාටිය අධ්‍යක්ෂ විසින් සකස්කර, අධිකාරියේ අනුමැතිය මත ක්‍රියාත්මක කළ යුතු ය.

(6) අධිකාරියේ සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විෂයභාර අමාත්‍යාංශ ලේකම් වන අතර, ගණන්දීමේ නිලධාරියාවන සභාපති හා අධ්‍යක්ෂ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු වන්නේ ය.

(7) බස්නාහිර පළාත් සෞදර්ය නිකේතනය විසින් උපයාගන්නා ආදායම හා වියදම් මත පදනම්ව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන සභාපතිගේ මාසික දීමනාවන්, අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ගෙවිය හැකිය.

(8) රජයෙන් සහ බස්නාහිර පළාත් සභාවෙන් නිකුත් කරන ලද, ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සහ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව අධිකාරිය ක්‍රියා කළ යුතු ය.

(9) බස්නාහිර පළාත් සභා කටයුතුවල වැඩසටහන් සඳහා අධිකාරිය මගින් අය කරනු ලබන මුදලින් 50%ක් හෝ මූලික පිරිවැය ගණනය කර එම මුදලට 25%ක් එකතු කර ලැබෙන මුදල හෝ යන දෙකෙන් වඩා වැඩි අගය දරන මුදල අවමය වන පරිදි, විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ මත, විශේෂ අනුග්‍රහයක් ලබා දිය හැකිය.

(10) අධිකාරිය අයත් පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ වැඩ සටහන් සඳහා එම වැඩ සටහනේ, මූලික පිරිවැය ගණනය කර, එම මුදලට 15%ක් එකතු කරන ලබන මුදලකට, අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, එකී වැඩසටහන පැවැත්වීමට අනුග්‍රහයක් ලබාදිය හැකිය.

(11) අධිකාරිය විසින් අධිකාරියේ පාලන රෙගුලාසි සහ මූල්‍ය රීති සකස් කර ගන්නා තෙක්, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන බල පවත් වන්නේ ය.

(12) අධ්‍යක්ෂවරයා සභාපතිවරයාගේ පාලනයට යටත්වන අතර, අනෙකුත් සියලුම නිලධාරීන් අධ්‍යක්ෂවරයාගේ පාලනයට යටත් වේ.

(13) අධිකාරියේ කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත සේවක සංඛ්‍යාව තුළ සහ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද බඳවා ගැනීම් පරිපාටි අනුව, එකී පත්වීම් උසස් කිරීම් සහ සේවයෙන් පහකිරීම කළ යුතුයි.

(14) විෂයයභාර අමාත්‍යාංශ ලේකම් විනය බලධාරියා වේ.

පාලන අධිකාරියේ අරමුණු, බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කර ගැනීම.

05. (1) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ උන්නතිය පිණිස හෝ අභ්‍යාසලාභීන්ගේ අභිවෘද්ධිය පිණිස මුදල් අය කරන සෞන්දර්ය විෂය පාඨමාලාවන් පවත්වාගෙන යා හැකිය.

(2) බාහිර උපදේශකවරුන්ට සෞන්දර්ය විෂයයන් ඉගැන්වීම සඳහා ද මෙම ස්ථානය කුලියට දීම හෝ බදු දීම හෝ කළ හැකිය.

(3) බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තියේ අරමුණුවලට අනුකූල, දේශීය හෝ විදේශීය වශයෙන් මුදලින් හෝ ද්‍රව්‍යවලින් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග අදාල පරිදි ගිණුම්ගත කිරීම තොග ලේඛනගත කිරීම සිදුකළ යුතු ය.

(4) විදේශීය සංදර්ශන රඟ දැක්වීම, හුවමාරු කර ගැනීම, සෞන්දර්ය විෂයයන්ට අදාළ දේශීය විදේශීය ආයතන සමග සහ සම්බන්ධතා ඇති කරගත හැකිය.

10-321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.